දුරකථන ) 0112669192 , 0112675011
தொலைபேசி ) 0112698507 , 0112694033
Telephone ) 0112675449 , 0112675280

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax ) 0112692913

විද්‍යුත් තැපෑල ) postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
e-mail )

වෙබ් අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )
website )

මගේ අංකය )
எனது இல ) PA/EOH/FCAU/21/2015
My No. )

ඔබේ අංකය )
உமது இல )
Your No. : )

දිනය )
திகதி ) [illegible] April 2015
Date )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

# සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
# சுகாதாரம் மற்றும் சுதேசவைத்திய அமைச்சு
# Ministry of Health & Indigenous Medicine

විධාන අංක :10/2015

සියළුම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,
සියළුම ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,
අධ්‍යක්ෂ/ජාතික සෞඛ්‍ය විද්‍යායතනය, කළුතර.
සියළුම මහ නගර සභා/ නගර සභා ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිවරුන්,
සියළුම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිවරුන්,

**වෙසක් හා පොසොන් උත්සව නිමිති කර ගෙන පවත්වනු ලබන දන්සැල් පවත්වාගෙන යෑම.**

දිවයින පුරා බෞද්ධ සංවිධාන හා වෙනත් ප්‍රජා සංවිධාන විසින් සැදැහැ සිතින් පවත්වන දන්සැල් සංවිධානය වෙමින් පවතී.

සමහර අවස්ථාවලදී මෙවන් සමහර දන්සැල්වලින් ආහාර ලබාගත් සැදැහැවතුන් ආහාර විෂවීම් වලට ගොදුරුවූ බව වාර්තාවී ඇත. එකී තත්ත්වයන් වලක්වනු පිණිස ඔබ දිස්ත්‍රික්කයේ/ ප්‍රදේශයේ/ කොට්ඨාශයේ පැවැත්වීමට නියමිත දන්සැල් පිළිබඳ, සම්බන්ධයෙන් පහත ක්‍රියාමාර්ග අනුගමනය කරන ලෙසට ආහාර පනත යටතේ වන සියළුම බලයලත් නිළධාරිනට උපදෙස් ලබාදෙන ලෙස දැනුම්දෙමි. එසේම දන්සැලකදී ආහාර විකිණීමක් සිදුනොවන බවද අදාල බලයලත් නිළධාරීන් අවධානයට ලක්කල යුතුව පවතී.

උපදෙස්

1) දන්සැල් පවත්වාගෙන යෑමට යෝජිත ස්ථානය ලියාපදිංචිකිරිම.
2) ආහාර පිළියෙල කිරිමේදී, ගබඩාකිරිමේදී හා පිළිගැන්විමේදී පිළිපැදිය යුතු සනීපාරක්ෂක අවශ්‍යතා පිළිබඳ දන්සැල් සංවිධායකයින් පූර්ව දැනුවත්කිරිම.
3) සියළු දන්සැල් කටයුතු සඳහා බීමට සුදුසු ජලය යොදාගැනීමට උපදෙස් ලබාදීම හා එම පහසුකම් පවතිනබව තහවුරුකර ගැනීම.
4) දන්සැල් කටයුතු වලදී බැහැරලන අපද්‍රව්‍ය සෞඛ්‍යක්‍රමානුකූලව බැහැරලීමට උපදෙස් ලබාදීම හා එම කටයුතු පිළිබඳ පසුවිපරම..
5) ආහාර පිළියෙල කිරිමේදී, ගබඩාකිරිමේදී හා පිළිගැන්විමේදී ස්ථානීය පරීක්ෂණ සිදුකර තවදුරටත් උපදෙස් ලබාදීම.

මෙම පිළිබඳ ක්‍රියාත්මකකරන ලද වැඩසටහන් පිළිබඳ, දිස්ත්‍රික් මට්ටමේ සංක්ෂිප්ත වාර්තා අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුව පුරවා අදාල දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන් විසින් වෙසක් දන්සැල්වලට අදාල සංක්ෂිප්ත වාර්තාව 2015.06.01 දිනට ප්‍රථම හා පොසොන් දන්සැල්වලට අදාල සංක්ෂිප්ත වාර්තාව 2015.07.01 දිනට ප්‍රථම ලැබෙනසේ අධ්‍යක්ෂ/පාරිසරික හා වෘත්තීය සෞඛ්‍ය, සෞඛ්‍ය අමාත්‍යාංශය, කොළඹ 10 ලිපිනයට ලැබීමට සලස්වන ලෙස කාරුණිකව දැනුම්දෙමි.

වෛද්‍ය පී. ජී. මහීපාල
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
(ප්‍රධාන ආහාර බලධරයා)